# සංක්ෂිප්තය


ඉහළ සමාජ ආර්ථික තත්වයක් ඇති පාසල් සිසුන් තුළ පහළ සාධන මට්ටමක් දක්වන සිසුන්ද දක්නට ලැබේ. ඒ පිළිබඳව විමසිලිමත්වීම කාලීන අවශ්‍යතාවයකි.

නිවස ආශ්‍රිත ගැටළු, පාසල ආශ්‍රිත ගැටළු, සෞඛ්‍ය හා මානසික ගැටළු, මාධ්‍යය හා සමවයස් කණ්ඩායම් වල බලපෑම යනාදිය නිසා බොහෝ සිසුන්ගේ අධ්‍යාපන සාධනය අඩුවීම සිදුවන බව පෙනී යන කරුණකි. ඔවුන්ගේ සාධන මට්ටම අඩුවීම සඳහා හේතුවන කරුණු අනාවරණය කර ගැනීමෙන් හා එම ගැටළු මග හරවා ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශනයන් සැපයීමෙන් ඔවුන්ගේ අධ්‍යාපන සාධන මට්ටම තරමක් දුරට හෝ ඉහළ නැංවීමට හැකියාව ඇත.

ඉහළ ආර්ථික මට්ටමක් ඇති සිසුන්ගේ පහළ අධ්‍යාපනික සාධන මට්ටම ඇතිවීම පිළිබඳව සෙවීම සඳහා කරන ලද මෙම පර්යේෂණයේ නියැදිය ලෙස සිසුවියන් 40 ක් තෝරා ගන්නා ලද අතර ඔවුන්ගෙන් ලත් තොරතුරු විශ්ලේෂණය කිරීම මගින් අධ්‍යයනය සිදු කරන ලදී. මෙම අධ්‍යනයේ නිගමන ලෙස පහත සඳහන් කරුණු කෙටියෙන් දැක්වීමට පුළුවන.

තමන්ගේ හැකියාවන් හා සම තත්වයේ දරුවන් හා සමඟ අධ්‍යාපනය ලැබීමට හැකිවීම දරුවගේ සාධන මට්ටම ඉහළ යාමට හේතු වන බව.

දරුවන් හඳුනාගෙන ඔවුනට උචිත පරිදි පරිසරයක් ගොඩනගා අධ්‍යාපනය ලබා දීමට හැකියාවක් ඇති ගුරුවරුන් දරුවන්ගේ සාධන මට්ටම ඉහළ ගෙන ඒමට හේතුවන බව.

ක්‍රියාශීලි සුහද, ක්‍රමානුකූල වූ පැහැදිලි අරමුණු සහිත දරුවන්ට වඩා විසිරුනු අදහස් ඇති, ක්‍රමානුකූල නොවන, අවුල් වූ කලබල මනසක් ඇති දරුවන් අඩු සාධන මට්ටම් දක්වන බව.

විෂය හා විෂය බාහිර කටයුතුවලට වැඩි අවධානය යොමු නොකරන, විලාසිතා, විනෝදාත්මක දෑ වැනි බාහිර කරුණු වෙත වැඩි අවධානය යොමු වූ දරුවන්ගේ අධ්‍යාපන සාධන තත්වය පහත් තත්වයක පවතින බව.